**ශීර්ෂය - 245 රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

ශීර්ෂය 245 - රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තොරතුරු රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 අගෝස්තු 09 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදි. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත සහ සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වු ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය සඳහා අග්‍රිම ඉල්ලීම් සැලසුම අනුව ඉල්ලුම් කල යුතු අග්‍රිම එකතුව රු.මිලියන 100.29 ක් වුවද, රු.මිලියන 117.54 ක් ඉල්ලුම් කර රු.මිලියන 97.172 ක අග්‍රිමයක් ලබාගෙන තිබුණි. | අක් මුදල් සැලසුම් පිළියෙල කරන අවස්ථාව වන විටත් මෙම දෙපාර්තමේන්තුව පවරා නොතිබුණු වැය විෂය අංක 102-01-02-024-2509 යටතේ වූ 253,287,166.67 ක් 2023 ජනවාරි 25 වන දින මෙම දෙපාර්තමේනත්තුව වෙත පවරා දී ඇත. නමුත් 2023 පෙබරවාරි මස සිට සැප්තැම්බර් මස දක්වා වියදම් දැරීමට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව අක් මුදල් ලබා ගැනීම හේතුවෙන් සැලසුම් කළ හා වියදම් කළ අග්‍රිම අතර රු.මි.17.25 ක වෙනසක් පැන නැගී ඇත. | අග්‍රිම ඉල්ලීම විධිමත් පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

### 2.2 වියදම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයයන් 02 ක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසා එකතුව රු.1,150,000 ක ප්‍රමාණයක් සියයට 50 සිට සියයට 567 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි. | දෙපාර්තමේන්තු පාලනයෙන් තොර හේතුන් නිසා ඇස්තමේන්තුගත ප්‍රතිපාදන සීමාව ඉක්මවා අමතර ප්‍රතිපාදන මු.රෙ.66 යටතේ මාරුකර ගැනීමට සිදුවූයේය. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව, ඇස්තමේන්තු පිළියෙල කිරීම නිවැරදිව හා තාත්විකව කළ යුතු වීම. |
| (ආ) | වැය විෂයය අංක 245-1-1-0-1002 සඳහා වූ මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය උපයෝජනය නොවීම හේතුවෙන් රු.1,175,000 ක් හෙවත් මූලික ඇස්තමේන්තු ප්‍රතිපාදනයෙන් සියයට 11 කින් මුදල් රෙගුලාසි 66/69 යටතේ මාරු කිරීම් මඟින් ප්‍රතිපාදන අඩුකර තිබුණි. | ඉතිරිවූ ප්‍රතිපාදන දෙපාර්තමේන්තු පාලනයෙන් බැහැරව අනපේක්ෂිතව දැරීමට සිදුවූ වියදම් ආවරණය කර ගැනීම සඳහා මු.රෙ.66 යටතේ ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත ප්‍රතිපාදන මාරුකර ගැනීම. | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සැලසුම් කරන ලද කාර්යයන් ඉටු කිරීමට වැය විෂයයන් 11 ක් සඳහා 2023 වර්ෂයේදී වෙන් කරන ලද රු.106,525,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.76,454,182 ක් උපයෝජනය කිරීමෙන් තොරව ඉතිරි වී පැවතුණි. එය එම වැය විෂයයන්ගේ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 85 ක සැලකිය යුතු පරාසයක් ගෙන තිබුණි. | වැය විෂයන් 11 ක් අතරින් 245-1-1-2-2509(11) වැය විෂය සඳහා වෙන්වූ රු.මිලියන 80 ක පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයෙන් රු.මිලියන 68.36 ක් ඉතිරිව ඇති අතර ඉතිරි වැය විෂයන් 10 න් රු.මිලියන 8.09 ක ප්‍රතිපාදන ඉතිරිව ඇත. | ප්‍රතිපාදන උපරිම අයුරින් කාර්යක්ෂම ලෙස උපයෝජනය කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 කාර්යභාරයන් ඉටු කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2018 අගෝස්තු 18 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය අනුව අරමුදල් 13 ක් වසා දැමීමට නිර්දේශ කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් අරමුදල් 3 සම්බන්ධයෙන් කටයුතු අවසන් කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | ජාතික උද්භිද උද්‍යාන අරමුදල, ස්වාධීන ආයතනයක් ලෙස නැවත ස්ථාපිත කිරීම සඳහා ඉල්ලීම් ලිපි වරින් වර ඉදිරිපත් වී ඇතත් එළඹි අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව නිකුත් කරන ලද චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතු බව දැන්වීම, වාහන, වායු විමෝචන නිරීක්ෂණ, භාරකාර අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා යෝග්‍ය නිර්දේශ ඉදිරිපත්කිරීම, නැවත ස්වයං රැකියා චක්‍රීය අරමුදල වසා දැමීමට කටයුතු කරන ලෙස දැනුම් දී ඇත. | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් ඉටු කිරීම සම්බන්ධ විධිමත් සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වීම. |

#### 3.1.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ආයතන වෙත රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වා දීම පිළිබඳව වූ 2018 ඔක්තෝබර් 23 දිනැති අංක 05/2018 හා 2019 දෙසැම්බර් 17 දිනැති අංක 08/2019 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව රාජ්‍ය ප්‍රසම්පාදන අස්ථිත්ව ලියාපදිංචිය, සම්බන්ධීකරණ නිලධාරීන් ලියාපදිංචිය, සැපයුම්කරුවන් ලියාපදිංචිය, වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ඉදිරිපත් කිරීම, ප්‍රසම්පාදන දැන්වීම් | රාජ්‍ය විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය හඳුන්වාදීම 2018 සිදු වුවත් අදාල පුහුණුව හා ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් 2023 වර්ෂයේ අග භාගයේ සිදුකල බැවින් 2024 වර්ෂයේ ආරම්භයේ | අදාල චක්‍රලේඛය පරිදි කටයුතු කළ යුතු වීම. |

| | |
|---|---|
| ප්‍රසිද්ධ කිරීම, මිල සැඳහුම් ක්‍රමයට විද්‍යුත් ප්‍රසම්පදන පද්ධතිය භාවිතා කිරීම ආදී කටයුතු රාජ්‍ය ආයතන විසින් සිදු කළ යුතු බව දක්වා තිබුණි.<br><br>එසේවුවද, දෙපාර්තමේන්තුව විසින් ඉහත චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු නොකර 2023 වර්ෂයේදී අවස්ථා 10 දී එකතුව රු.1,376,086 ක් වූ ප්‍රසම්පාදන අයිතමයන් විද්‍යුත් ප්‍රසම්පාදන පද්ධතිය භාවිතයෙන් තොරව මිල සැඳහුම් ක්‍රමයට සපයාගෙන තිබුණි. | සිට දෙපාර්තමේන්තුව විසින් මෙම පද්ධතිය හරහා මිලදී ගැනීම් සිදු කිරීමට කටයුතු යොදා ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ අනුමත තනතුරු 80 ක් වූ අතර, ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටම තනතුරු 11 ක් ද, ද්විතීයික මට්ටමේ තනතුරු 06 ක් සහ ප්‍රාථමික මට්ටමේ තනතුරු 02 ක් ද ඇතුළුව තනතුරු 19 ක් පුරප්පාඩුව පැවතුණි. | මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිරීක්ෂණ නිවැරදිය. | පුරප්පාඩු පිරවීමට හෝ උචිත පරිදි අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනයට පියවර ගත යුතුය. |